# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.04.05 පැය 1345 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 654 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

## 01. තියුණු ආයුධයකින් පහරදී කාන්තාවක් ඝාතනය කර තවත් පුද්ගලයෙකුට තුවාල සිදු කිරීම- ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසම

2025.04.05 වන අද දින අළුයම් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ මුවදොර උයන මහල් නිවාස සංකීණර්යේ කාන්තාවක් සහ පිරිමි පුද්ගලයෙකු කැපුම් තුවාල සහිතව කොළඹ ජාතික රෝහලට ඇතුලත් කර ඇති බවට ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව ග්‍රෑන්ඩ්පාස් පොලිසිය විසින් විමශර්න ආරම්භ කර ඇත.

කොළඹ ජාතික රෝහලට ඇතුලත් කරන ලද තුවාලකාරිය වෛද්‍යවරුන් පරීක්ෂා කිරීමේදී මිය ගොස් සිට ඇති අතර තුවාලකරු තවදුරටත් රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියි.

**මරණකාරිය වයස අවුරුදු 60 ක් වූ සහ තුවාලකරු වයස අවුරුදු 26 ක් වන මෝදර උයන මහල් නිවාස සංකීණර්යේ පදිංචිකරුවන් වේ.**

මරණකාරියගේ ස්වාමිපුරුෂයා සමඟ ඇති වූ පවුල් ආරවුලක් හේතුවෙන් ඇගේ සැමියා විසින් මෙම ඝාතනය සිදු කර ඇති බවට හා දෙදෙනා අතර ඇති වූ ආරවුලට මැදිහත් වූ අනෙක් පුද්ගලයාටද මරණකාරියගේ ස්වාමිපුරුෂයා විසින් තියුණු ආයුධයකින් පහරදීම සිදු කර ඇති බවද දැනට සිදු කරන ලද විමශර්න වලට අනුව අනාවරණය වී ඇත.

සිද්ධියට සම්බන්ධ සැකකරු සිද්ධියෙන් පසු ප්‍රදේශයෙන් පලා ගොස් ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා ග්‍රෑන්ඩ්පාස් පොලිසිය විමශර්න සිදු කරනු ලබයි.

## 02. නිවසක මුදල් හා රන් භාණ්ඩ සොරකම් කළ සැකකාරියන් හා සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට - අළුත්ගම පොලිස් ස්ථානය.

2025.04.03 වන දින අළුත්ගම පොලිස් වසමේ අළුත්ගම ප්‍රදේශයේ නිවසක රුපියල් 5,081,000/= ක් වටිනා මුදල් හා රන් භාණ්ඩ සොරකම් කර ඇති බවට අළුත්ගම පොලිස් ස්ථානයට ලැබී තිබූ පැමිණිල්ලක් අනුව අළුත්ගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් විමශර්න ආරම්භ කර ඇත.

**ඒ අනුව එකම පවුලේ වයස අවුරුදු 51 ක් වන මව, අවුරුදු 22 හා 11 යන වයස් වල පසුවන පුත්‍රයින් දෙදෙනෙකුද සොරකම සඳහා ආධාර අනුබල දුන් වයස**

**අවුරුදු 16 ක් වන දැරියක් අත්අඩංගුවට ගෙන ඇති අතර ඔවුන් බේරුවල හා අලුත්ගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සොරා ගන්නා ලද රන් භාණ්ඩ හා මුදල් වලින් කොටසක් පොලිස් භාරයට ගෙන ඇත. එක් සැකකාරියක් හා සැකකරුවෙකු 2025.04.04 වන අළුත්ගම මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2025.04.07 වන දක්වා රක්ෂිත බන්ධනාගාර ගත ඇත. අනෙක් දෙදෙනා ඇප මත මුදා හැර ඇති අතර අළුත්ගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. රිය අනතුරකින් පොලිස් නිලධාරියෙකු මිය යාම - පොලොන්නරුව පොලිස් වසම

2025.04.04 වන දින රාත්‍රී කාලයේ පොලොන්නරුව පොලිස් වසමේ මඩකලපුව කොළඹ ප්‍රධාන මාගර්යේ ගල්ලැල්ල ප්‍රදේශයේදී පුද්ගලයෙකු යට කර රිය අනතුරක් සිදු කර රථය පලා ගොස් ඇති බවට 119 තොරතුරු මධ්‍යස්ථානයෙන් පොලොන්නරුව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් අනුව විමශර්න ආරම්භ කර ඇත. රිය අනතුරට ලක් වූ පුද්ගලයා සිද්ධිය සිදු වූ ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වූ පොලොන්නරුව ප්‍රදේශයේ පදිංචි පොලොන්නරුව පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කරන ලද පොලිස් සැරයන්වරයෙකි.**

මරණකරු පාගමනින් ගමන් කරමින් සිටියදී මෙම අනතුරට මුහුණ දී ඇති අතර මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පොලොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පලා ගිය රථය සොයා පොලොන්නරුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**